# මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය

# ප්‍රවෘත්ති නිවේදනය

**මෙම ජාතික ශෝක අවස්ථාවට මුහුණ දුන් සහෘදයන්ට මානසික අත්වැලක් සැපයීම.**

පාස්කු ඉරිදා සිදුවූ අනර්ථකාරී ව්‍යවසනයෙන් පීඩාවට පත්වූ විවිධ පාර්ශ්වයන්ගේ ශෝකය, ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය වශයෙන් අපිද බෙදා ගනිමු. මෙහිදී, මූලික සාමාන්‍ය මානසික උපකාර ලබාදීම හා විශේෂිත මානසික ප්‍රතිකාර ලබාදීම ගැන හැදින්වීමක් ලබාදීමට අපි අදහස් කරමු.

**මනෝ විද්‍යාත්මක ප්‍රථමාධාර**

මනෝ විද්‍යාත්මක ප්‍රථමාධාර යනු ආපදා තත්ත්වයකදී කරදරයකට පත්වූ සහෘදයෙකුට ලබාදිය හැකි මූලික මානුෂීය සහනය ලබාදීමයි. මෙහි ප්‍රධාන පියවර පහත දැක්වෙයි.

1. උපකාර අවශ්‍ය අය හඳුනාගෙන ඔවුනට අවශ්‍ය ආරක්ෂාව හා ආධාර උපකාර ලබාදීම.
2. සංවේදී කරුණු අනාවරණය කිරීමට බල නොකර ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා හා ගැටළු හඳුනාගැනීම හා ඊට අවශ්‍ය උපකාර ලබාදීම.
3. ඔවුන් තවදුරටත් පීඩාවට ලක්වීම වැළැක්වීම.
4. පීඩාවට ලක්වූවන්ගේ පෞද්ගලිකත්වයට හා ආත්ම ගරුත්වයට නිරන්තරයෙන් ගරු කිරීම.
5. ජාතියක් ලෙස අපි විවිධ ආපදා වලට මුහුණ දී ඇත්තෙමු. ආපදා වලට මුහුණ දීමට අවශ්‍ය බලවත් සංස්කෘතික යාන්ත්‍රණයක් අප සතුව ඇත. අපගේ සියළු මැදිහත්වීම් එම යාන්ත්‍රණයට අනුකූල හා ගරු කරන මැදිහත් වීම් විය යුතුය.

**මනෝ වෛද්‍ය ප්‍රතිකාර හා චිකිත්සක ක්‍රම**

අත්වූ විනාශයේ ප්‍රබලත්වය සලකා බලන විට ඉහත ප්‍රථමාධර වලට අමතරව තීව්‍ර මනෝ වෛද්‍ය ප්‍රතිකාර හෝ චිකිස්සාවන් අවශ්‍ය පිරිසක් සිටිය හැකිය. එවන් කෙනෙකු මනෝ වෛද්‍යවරයෙකු මුණගැසීමට හෝ මනෝ වෛද්‍යවරයෙකු වෙත යොමු කිරීමට පසුබට විය යුතු නැත. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රධාන රෝහලකම පාහේ මනෝ වෛද්‍යවරු හා ඔවුන්ගේ කණ්ඩායම් සේවය කරති. තමන් වෙත එන සේවාලාභීන්ට අවශ්‍ය සියළු ප්‍රතිකාර ලබාදීමට ඔවුහු නිරන්තරයෙන් බැඳී සිටිති.